# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1783/24 - 2012 නොවැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2012.11.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම

සබරගමුව පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65 අ (1) වන වගන්තිය යටතේ, සභාපති වන බී. පී. ඉඳුනිල් ශාන්ත ගුණසේන නම් වූ සභාපති අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කෝරලේ ගෙදර පියතිස්ස මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කෝරලේ ගෙදර පියතිස්ස මහතා මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරී,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2012 නොවැම්බර් මස 06 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

11 - 867

1A - G 16857 — 360 (2012/11)

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන ප්‍රියන්ත උදය කුමාර මහතා එක්සත් ජනතා නිදහස් සන්ධානය පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ සභික ධූරය ඔහු විසින් අත් හැර ඇති බව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරී,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2012 නොවැම්බර් මස 05 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

11 - 868

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.